# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/63 - 2020 ජනවාරි මස 25 වැනි සෙනසුරාදා - 2020.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කරනු ලබන නිවේදනයයි**

මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් තැනැත්තන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ බැවින් ද,

02. 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වගන්තියට අනුව,

2.1 අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ හෝ අවතැන් වී සිටි තැනැත්තෙකු ව සිටියාවූ ද,

2.2 2009 වර්ෂය අවසන්වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත්වන්නා වූ ද,

2.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූද,

යන කරුණු නිශ්චිතව ඔප්පු කරනු ලැබීම මත සහ ඉල්ලුම්කරු අභ්‍යන්තර වශයෙන් අවතැන්ව සිටි තැනැත්තකු බව දැනට පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 දිනට පෙර තමා ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචිකර ගැනීම සඳහා අදාළ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් කිරීමට ඉහත කී පනතෙන් හිමිකම් ලබා දී ඇති බැවින් ද,

03. ඉහත සඳහන් විශේෂ විධිවිධාන පනතේ 2 (3) වන වගන්තියට අනුව ඉහත 2 ඡේදයේ සඳහන් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් වූ,

3.1 අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ දිනයේදී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූද, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේදී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.2 එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බවට පත්වීමෙන් පසුව ඉපදී ඉල්ලීම් කරනු ලබන අවස්ථාවේදී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූද,


1A - G 31861 — 67 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තැනැත්තන්ට තම උප්පැන්න සහතිකය සහ ග්‍රාම නිලධාරී විසින් ඉහත සඳහන් කරුණු සනාථ කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත 2009 මැයි මස 18 දිනට පෙර තමා හෝ තම දෙමව්පියන් අවතැන්වූවකු බවට පත්වීමට පෙර ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලබා දී ඇති බැවින් ද,

04. 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත 02 සහ 03 ඡේදවල සඳහන් සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගේ නම් ඇතුළත් කොට 2019 වර්ෂය සඳහා පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කිරීම සඳහා ඉල්ලුම්පත් භාර ගැනීම 2020 ජනවාරි මස 25 වැනි දින ආරම්භ කොට 2020 ජනවාරි මස 31 දින අවසන් කරන බවත් අදාළ ඉල්ලුම්පත්‍ර දිවයිනේ සියළුම මැතිවරණ කොට්ඨාස වල ලියාපදිංචි කිරීමේ නිලධාරී කාර්යාලවලින් ලබා ගත හැකි බවත් නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් අදාළ ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලෙසත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

05. ඉහත 04 ඡේදයේ සඳහන් පරිපූරක ලැයිස්තුව සකස් කිරීම 2020 පෙබරවාරි මස 01 වන දින අවසන් කර ඒ පිළිබඳ නිවේදනය 2020 පෙබරවාරි මස 01 වැනි දිනම නිකුත් කිරීමට අපේක්ෂිත බවත් එම ලැයිස්තුවට නම් ඇතුළත් නොවූ ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන්ට ස්වකීය නම් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට එදින සිට දින 14 ක අමතර කාලසීමාවක් ලබා දීමට කටයුතු කරන බවත් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එන්. ජේ. අබේසේකර,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. රත්නජීවන් එච්. හූල්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2020 ජනවාරි මස 20 වැනි දින,
රාජගිරිය,
සරණ මාවත,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

02 - 114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.